# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2015 ඔක්තෝබර් මස 06 වන අඟහරුවාදා

### බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම

පූ.භා. 09.33 ට සභාව රැස්විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

- **පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ඉසුර දේවප්‍රිය | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, කර්මාන්ත සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ලලිත් වනිගරත්න | (බස්නාහිර පළාතේ ධීවර, මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු සුනිල් ජයමිණි | (සභා නායකතුමා) |
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු සුමිත් ලාල් මැන්දිස් | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා
අනුරාධ විමලරත්න
අනුරුද්ධ ලේකම්ගේ
අසෝක රන්වල
අශෝක දයාරත්න
අමල් සිල්වා
අර්ෂාඩ් නිසාම්ඩීන්
ඇන්ටනී උපුල් රාජිත
ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්
ඊ.ඒ. නන්දන පත්මකුමාර
උදාර රත්නායක
උදේන විජේරත්න
උපාලි කොඩිකාර
උපාලි ගුණරත්න
උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ
එස්.ඒ. සමන්මලී සකලසූරිය මෙනෙවිය
ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව
කාමල් කුරුප්පු
කිත්සිරි කහටපිටිය
කීර්ති කාරියවසම්
කුරුසාමි කලන්කාඩි තේවර්
කේ.ඩී. අරුණ දීපාල්
කොලන්නගේ වජිර පෙරේරා
ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා
ගුණසිරි ජයනාත්
චන්දන ජයකොඩි
ජගත් කුමාර
ජගත් පී. විතාන
ජනක දීපාල් වැලිවත්ත
ජයන්ත ද සිල්වා
ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා
ඩෝල්ටන් ජානක සූරියබණ්ඩාර
තුවාන් ආමිත් මොහමඩ් අක්රම්
තෙබුවන පියනන්ද හිමි
නව්සර් ෆව්සි
නිමල් ආර්. පීරිස්
නිමල් චන්ද්‍රරත්න
නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන
නිරෝෂන් පාදුක්ක
නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු
පී.ආර්.පී. අබේගුණවර්ධන
පී.ඩී. අබේරත්න
ප්‍රදීප් උඳුගොඩ
ප්‍රදීප් පෙරේරා
බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන
මහින්ද ජයසිංහ
මහේෂ් අල්මේදා
මංජුල ප්‍රසන්න සම්පත්
මංජුල බුද්ධදාස
මෙරිල් පෙරේරා
මොරිස් විජේරත්න
මොහොමඩ් ෆායිස්
යූ.එල්.එන්.පී. උඩවෙල
රජිත හපුආරච්චිගේ
රන්දීර් රොද්‍රිගෝ
රවී විජේසේකර
රොජර් සෙනෙවිරත්න
රෝස් ප්‍රනාන්දු මෙනෙවිය
ලක්ෂ්මන් නිපුණ ආරච්චි
ලයනල් ජයසිංහ
ලලන්ත ගුණසේකර
ලලිත් එල්ලාවල
ලලිත් වර්ණකුමාර
ලෙනාඩ් කරුණාරත්න
සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය
සරත් පතිරණ
සරත් සුමනසේකර
සලෝචන ගමගේ
සහන් ප්‍රදීප්
සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා
සුසාර දිනාල්
සුසිල් කිඳෙල්පිටිය
සෙනල් වෙල්ගම
ශිරන්ත අමරසේකර
හරිස්චන්ද්‍ර කොස්තා
හෙක්ටර් බෙත්මගේ

**නොපැමිණීම :**

**ගරු මන්ත්‍රීවරු**

ආනන්ද රංජිත් රූපසිංහ
ඇ. ශ්‍රීනාත් ම. පෙරේරා
ඉන්දික බණ්ඩාර
එම්.එස්.එම්. රහීම්
එස්. කුගවරදන්
කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය
ජගත් අංගගේ
නිරෝෂා අතුකෝරල මැතිනිය
මල්ෂා කුමාරණතුංග මැතිනිය
මොහොමඩ් ෆයිරුස්
රවීන්ද්‍ර යසස් කුමානායක
රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්
රොයිස් විජිත ප්‍රනාන්දු
විජිත් ප්‍රියන්ත
සුනිල් වටගල
සේනක දමයන්ත ද සිල්වා
ශ්‍රීනාත් පෙරේරා

## 01. ගරු සභාපතිතුමාගේ නිවේදන :

*i*

*" සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී තීරණය වූ පරිදි, මන්ත්‍රී පෞද්ගලික කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා පුහුණු වැඩ මුළුවක්,[1] 2015 ඔක්තෝබර් මස 30 වන දින කොළඹදී පැවැත්වෙන බව, ගරු සභාපතිතුමා විසින් සභාවට දන්වන ලදී."*

*ii*

*" එස්. කුහවරදන් ගරු මන්ත්‍රීතුමා, ප්‍රජාතන්ත්‍රවාදී ජනතා පෙරමුණ නමැති දේශපාලන පක්ෂයේ බස්නාහිර පළාතේ පළාත් සභාවේ මන්ත්‍රී කණ්ඩායමේ නායක ලෙස (පක්ෂයේ මහ ලේකම්ගේ 2015.09.22 දිනැති ලිපිය ප්‍රකාරව) නම් කර ඇති බැවින් එය තමා විසින් පිළිගනු ලැබූ බව ගරු සභාපතිතුමා විසින් සභාවට දන්වන ලදී. "*

*iii*

**කාරක සභා පත් කිරීම් :**

*"ප්‍රඥප්ති හා නීති කාරක සභාව වෙනුවෙන් රසික මංජුල බුද්ධදාස ගරු මන්ත්‍රීතුමා සහ ජනක දීපාල් වැලිවත්ත ගරු මන්ත්‍රීතුමා ද, සභා කටයුතු කාරක සභාව වෙනුවෙන් මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා සහ සරත් සුමනසේකර ගරු මන්ත්‍රීතුමා ද, පෙත්සම් කාරක සභාව වෙනුවෙන් ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා ද පත් කර ඇති බව ගරු සභාපතිතුමා විසින් සභාවට දන්වන ලදී."*

*iv*

*" ඇතැම් ගරු මන්ත්‍රීවරුන්ගේ සභා මේසය මත තබා ඇති සභාගත කරන ලද මාස 06 කට පෙර බෙදා හරින ලද ලිපි ලේඛන සභා මේසයෙන් රැගෙන නොයන්නේ නම්, ඉන් ඉවත් කරන බව ගරු සභාපතිතුමා විසින් සභාවට දන්වන ලදී."[2]*

2015.09.22 වන නිල වාර්තාවේ (හැන්සාඩ්) සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා විසින් කරන ලද පෞද්ගලික පැහැදිලි කිරීම ඇතුළත් 20 වන පිටුවේ 1240 තීරුවේ 10 වන පේළියේ සඳහන් "අයිවන් සරත්" යන්න "අයිවන් සනත්" ලෙස නිවැරැදි විය යුතු ය.

## 02. කාරක සභා වාර්තා :

ගරු සභාපතිතුමා විසින් 2015.09.23 වන දින පැවැති සභා කටයුතු කාරක සභා රැස්වීම් වාර්තාව සභාවට පිළිගන්වන ලදී.

***පූ.භා. 10.35 ට පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින්, පූ.භා. 11.35 ට ගරු නියෝජ්‍ය සභාපතිතුමාගේ [යසපාල කෝරළගේ මහතා] ප්‍රධානත්වයෙන් යළිත් රැස්විය.***

---

[1] 2015.10.06 දින නිල වාර්තාව බලන්න.
[2] - එම -

***පූ.භා. 11.40 ට උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා විසින් ගණ පූරණය පිළිබඳ ප්‍රශ්නය නගන ලදුව, එවලේ සභාවේ ගණ පූරණය නොමැති බව පෙනී ගියෙන් කැඳවීම් සීනුව නාද කිරීමට නියෝග කරන ලද අතර, පසුව ගණ පූරණය ඇති විය.***

## 03. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව I : පළාතේ පාසල් දරුවන්ගේ දෙමව්පියන්ගෙන් මුදල් එකතු කිරීම නතර කිරීම

**මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද, අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.**

*"බස්නාහිර පළාත තුළ මේ වන විට පාසැල් දරුවන්ගෙන්, දෙමාපියන්ගෙන් විටින්විට මුදල් අය කිරීම් සිදු වේ. පළමුවන ශ්‍රේණිය, හයවන ශ්‍රේණිය සහ දොළොස්වන ශ්‍රේණිය සඳහා දරුවන් ඇතුළත් කර ගැනීමේදී මෙන්ම වෙනත් පන්තිවල අවශ්‍යතා සඳහාද දරුවන්ගේ දෙමව්පියන්ගෙන් මෙලෙස මුදල් එකතු කිරීම නිසා ඔවුන් දැඩි දුෂ්කරතාවයකට පත් වී ඇත. එබැවින් බස්නාහිර පළාත තුළ දරුවන්ගේ දෙමව්පියන්ගෙන් මුදල් එකතු කිරීම (පහසුකම් ගාස්තු හැර) නතර කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි."*

## 04. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව II : පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීම විධිමත් කිරීම

**ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද, මංජු ශ්‍රී අරංගල - ගරු විපක්ෂ නායකතුමා විසින් ස්ථිර කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.**

*"බස්නාහිර පළාත් පාසැල් සඳහා 1 වන ශ්‍රේණියට ළමුන් ඇතුළත් කර ගැනීමේදී දරුවන් හා දෙමව්පියන් පීඩාවට පත් කරන වර්තමාන ක්‍රමවේදය වෙනස් කිරීමේ අවශ්‍යතාවය මතුව ඇත. ඒ සඳහා දරුවන් පාසලට ඇතුළත් කර ගන්නා දින සිට මාසයක් ඉක්ම යාමට පෙර සියලු පුරප්පාඩු පුරවා අවසන් කිරීමත්, ආරක්ෂක අංශවල සේවයේ නියුක්ත වූවන්ගේ දරුවන්ගේ නාම ලේඛනය දරුවන් ඇතුළත් කර ගත් දිනයේ සිට සති 03 ක් ඉක්ම යාමට පෙර පළාත් සභාවට ලැබීමට සැලැස්වීමත්, පාලක පක්ෂ මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන නාම ලේඛනයට අනුව ළමුන් ඇතුළත් කර ගන්නා ක්‍රමය අහෝසි කිරීමත්, සම්මුඛ පරීක්ෂණවලට සහභාගි වන සෑම දරුවෙකුටම ලැබෙන ලකුණු අනුව ස්ථිර ලේඛනයක් ලකුණු අනුපිළිවෙළට අනුව සකස් කිරීමත් ලබා ගන්නා ලකුණු අනුපිළිවෙලට අනුව පාසලට දරුවන් ඇතුළත් කිරීමට පියවර ගැනීමත් කළ යුතු යැයි ද, ඒ අනුව බස්නාහිර පළාතේ පාසැල්වල පළමුවන ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමේ කටයුතු විධිමත් කර පාසලකට දරුවෙකු ඇතුළත් කිරීමට තිබෙන මානව අයිතිය පළාතේ ජනතාවට තහවුරු කළ යුතු යැ'යි ද මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි. "*

## 05. රීති අංක 30 යටතේ යෝජනාව :

නිශාන්ත ශ්‍රී වර්ණසිංහ - ගරු සභා කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"අද දින වැඩ කටයුතු අවසන් වනතුරු සභාවේ කාලය දීර්ඝ කළ යුතු යැයි යෝජනා කරමි."*

***මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් රීති අංක 30 යටතේ ඉදිපත් කරන ලද ප්‍රශ්නමාලාව සඳහා රංජිත් සෝමවංශ ගරු අධ්‍යාපන අමාත්‍යතුමා විසින් එවලේ පිළිතුරු වාචිකව සපයන ලදී.***[3]

[3] 2015.10.06 වන දින නිල වාර්තාවේ අදාළ පිළිතුරු පළ කර ඇත.

## 06. **කල් තැබීම :**

පසුව ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් සභාව කල් තබන ලදී.

***ඊට අනුකූලව, පළාත් සභාව අ.භා. 01.45 ට, 2015 ඔක්තෝබර් මස 20 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,<br>
ලේකම්,<br>
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2015.10.06<br>
බස්නාහිර පළාතේ පළාත් සභාව,<br>
5 වන මහල,<br>
බී පර්යන්තය,<br>
සෙත්සිරිපාය,<br>
බත්තරමුල්ල.<br>
කුමා/06<br>
Minuts 2015.10.06 - Hansard Section